**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**තලවාකැලේ**

**අවවාදාත්මක නිවේදනය**

# එල් නිනෝ (El Niño) දේශගුණික තත්ත්වයන්ගෙන් තේ වගාවට සිදුවිය හැකි හානිය අවම කර ගැනීම සඳහා පෙර සූදානම් වීම

එල් නිනෝ (El Niño) යනු මධ්‍යම සහ නැගෙනහිර පැසිෆික් සාගරයේ මුහුදු මතුපිට උෂ්ණත්වය අසාමාන්‍ය ලෙස ඉහළ යාම හේතුවෙන් සිදුවන ස්වාභාවික දේශගුණික සංසිද්ධියකි. මෙම උණුසුම් වීම නිසා ගෝලීය කාලගුණ රටා වෙනස් කරන අතර, ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ ප්‍රදේශවල සාමාන්‍ය වර්ෂාපතන සහ උෂ්ණත්ව රටාවන් ට සැලකිය යුතු ලෙස බලපෑමක් ඇති කරයි. ගෝලීය සහ දේශීය කාලගුණ විද්‍යා ආයතන විසින්, 2026 වසර සඳහා ප්‍රබල එල් නිනෝ තත්ත්වයක් පුරෝකථනය කර ඇති අතර, ජාතික සාගර සහ වායුගෝලීය පරිපාලනයට (NOAA) අනුව, 2026 ජූනි - අගෝස්තු කාලය තුළ එල් නිනෝ තත්ත්වයක් මතුවීම සහ එය අවම වශයෙන් 2026 අවසානය දක්වා හෝ 2027 පෙබරවාරි දක්වා ක්‍රියාත්මක වීමට වඩා ඉඩකඩක් පවතී.

එල් නිනෝ වර්ෂයක දී, ශ්‍රී ලංකාවට අඩු වර්ෂාපතනයක්, වැඩි උෂ්ණත්වයක් සහ දිගු වියළි කාලසීමාවක් වැනි තත්වයන්ට මුහුණ දීමට සිදුවිය හැකිය. මෙම අහිතකර තත්ත්වයන් හේතුවෙන් පසෙ හි තෙතමනය අඩු වීම සහ පරිසර උෂ්ණත්වය ඉහළ යාම නිසා ශාක වර්ධනය අඩාල වීම, තේ අස්වැන්න අඩු වීම (දලු වර්ධනය සහ දලු හටගැනීම ප්‍රමාද වීම), මෙන් ම ඇතැම් රෝග සහ පළිබෝධ වැළඳීමේ ප්‍රවණතාව වැඩි වීම සහ වඩාත් දැඩි අවස්ථාවල දී ශාක මිය යාම පවා සිදුවිය හැකිය. මෙම බලපෑම්වල සමස්තයක් ලෙස දිගුකාලීන භූමි සහ බෝග ඵලදායිතාව මෙන් ම මුළු නිෂ්පාදනය ද අඩු විය හැකිය.

අහිතකර තත්ත්වයන්ට පෙර, එම කාලය තුළ සහ පසුව තේ නිෂ්පාදනයේ තිරසාරභාවය රැකගැනීම සඳහාත්, ඉහත විස්තර කර ඇති අහිතකර බලපෑම් අවම කර ගැනීම සඳහාත් පහත සඳහන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය නිර්දේශ කරනු ලැබේ.

**නියඟය ආරම්භ වීමට පෙර**

- නියඟයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති තේ වගා භූමිවල ට ප්‍රමුඛතාවය දීම සහ අහිතකර තත්ත්වයන් නිසා ඇතිවන ආතති තත්ත්වයන් අවම කිරීමට පියවර ගැනීම
- පවතින ජල ප්‍රභවයන් හඳුනා ගැනීම සහ අනාගත අවශ්‍යතා සඳහා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම
- වගාබිම් තුළ වැසි ජලය රැස් කිරීමේ පද්ධති ස්ථාපනය කිරීම
- විශේෂයෙන්ම නව වගාවන් සඳහා වසුන් යෙදීම (මානා හෝ ගෝතමාලා තෘණ වසුන්, රිදී-කළු පොලිතින් වැනි කෘතිම වසුන් හෝ කොළ, පිදුරු වැනි ඕනෑම සුදුසු ශාක ද්‍රව්‍ය)
- අලුතින් ස්ථාපිත තේ වගාවන් සඳහා තාවකාලිකව සෙවණ සැපයීම
- තෙතමනය සංරක්ෂණය කිරීමේ පියවරක් ලෙස ගලා යන ජලය ගබඩා කර ගැනීම සඳහා හරස් කාණුවල පිරී ඇති රොන්මඩ ඉවත් කිරීම
- කාබනික ද්‍රව්‍ය පසට එකතු කිරීම
- අධික සෙවණ (තෙතමනය සඳහා තරඟකාරීත්ව ඇති කරයි) සහ අඩු සෙවන (තාප ආතතිය ඇති කරයි) මඟහරවා ගනිමින්, හෙක්ටයාරයට / අක්කරයකට නිර්දේශිත සෙවණ ගස් ඝනත්වය සහ සමතුලිත සෙවණ මට්ටම පවත්වා ගැනීම

- ජලය සඳහා වන තරඟකාරීත්වය අඩු කිරීම සඳහා වියළි කාලයේ මුල් අවධියේදීම වල් පැළෑටි පාලනය කිරීම
- නියඟ තත්ත්වයන් ආරම්භ වීමට අවම වශයෙන් මාසයක ට පමණ පෙර 2% ක SOP (Sulphate of Potash) හෝ MOP (Muriate of Potash) දියර ලෙස පත්‍ර මතුපිටට ඉසීම

**වියළි කාලගුණය පවතින කාලය තුළ**

- ජල ප්‍රභවයන් සහ අනෙකුත් සම්පත් ඇත්නම්, බිංදු හෝ විසිරි ජලසම්පාදන පද්ධති ස්ථාපනය කිරීම
- නියඟයේ දැඩි බව අනුව සති 2-4 ක කාල පරතරයකින් 2% ක SOP (Sulphate of Potash) හෝ MOP (Muriate of Potash) දියර ලෙස අඛණ්ඩව පත්‍ර මතුපිටට ඉසීම
- **නොමේරූ තේ සඳහා** නියඟයේ දැඩි බව අනුව සති 2-4 ක කාල පරතරයකින් සැලිසිලික් අම්ලය (Salicylic acid) දියර ලෙස පත්‍ර මතුපිටට ඉසීම
    - 1 වන වසර – වතුර ලීටර් 100 කට ග්‍රෑම් 15/හෙක්ටයාරයට හෝ වතුර ලීටර 40කට ග්‍රෑම් 6/අක්කරයට
    - 2 වන වසර – වතුර ලීටර් 200 කට ග්‍රෑම් 30/හෙක්ටයාරයට හෝ වතුර ලීටර 80කට ග්‍රෑම් 12/අක්කරයට
    - 3 වන වසර – වතුර ලීටර් 400 කට ග්‍රෑම් 60/හෙක්ටයාරයට හෝ වතුර ලීටර 160කට ග්‍රෑම් 24/අක්කරයට
- රෝග සහ පළිබෝධ පැතිරීම සහ ඒවායේ ව්‍යාප්තිය නිරීක්ෂණය කිරීම සහ පූර්ව පාලන පියවර ගැනීම
- ආතතිය අඩු කිරීම සඳහා දලු නෙලීමේ කාල පරතරය සහ තීව්‍රතාවය වෙනස් කළ යුතු අතර, ඉතා දැඩි නියඟයක දී, දලු නෙලන තලයේ ඇති දලු මැලවීමක් නිරීක්ෂණය වන්නේ නම් අඟලක පමණ ළපටි දලු තට්ටුවක් ඉවත් කිරීම (Light skipping)
- වියළි කාල සීමාව තුළ යාන්ත්‍රික අස්වනු නෙලීමෙන් වැළකීම
- නියඟ කාලවල දී පොහොර යෙදීමෙන් වැළකීම
- නියඟ කාලසීමාව තුළ කප්පාදු කිරීමෙන් වැළකීම
- නැවත වගා කිරීම සහ පාළු සිටුවීම දැනටමත් ආරම්භ කර ඇත්නම්, පැළවලට ජල සම්පාදනය කිරීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන කාලගුණ අනාවැකි සහ කෘෂි-කාලගුණික උපදෙස් පිළිබඳව නිරන්තරයෙන් දැනුවත්ව සිටින ලෙස වගාකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

වැඩි විස්තර සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් නිකුත් කර ඇති PA 2 උපදෙස් චක්‍රලේඛය (Drought Mitigation in Tea Plantations) පරිශීලනය කිරීම හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය ඇමතුම් මධ්‍යස්ථානය (081-2244777) ඇමතීම සිදුකරන්න.

**අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**තලවාකැලේ**

**2026 ජූලි 07** වැනි දා